## ලකුණු ලියාපදිංචි කිරීමේදී භාණ්ඩ හා සේවා වර්ගීකරණය සඳහා යොදා ගැනෙන ජාත්‍යන්තර Nice වර්ගීකරණය (Nice Classification) අනුව භාණ්ඩ සහ සේවා පන්ති

### භාණ්ඩ

01 පංතිය — කර්මාන්ත, විද්‍යාත්මක හා ඡායාරූපකරණයේදී මෙන්ම කෘෂිකාර්මික, උද්‍යාන වගා හා වන කළමනාකරණ කටයුතුවලදී භාවිතා කිරීම සඳහා රසායනික ද්‍රව්‍ය; පිරිසැකසුම් නොකළ කෘත්‍රිම රෙසින, පිරිසැකසුම් නොකළ ප්ලාස්ටික්; ගිනි නිවීමට සහ ගින්න වැළැක්වීම සඳහා භාවිතා කරන මිශ්‍රණ; පදම් කිරීමේ හා පෑස්සීමේ කාර්යයන් සඳහා උපයෝගී කරගනු ලබන ද්‍රව්‍ය; සත්ත්ව හම් පදම් කිරීම සඳහා ද්‍රව්‍ය; කර්මාන්තවලදී භාවිතා කරන ඇලවුම් ද්‍රව්‍ය; පොටි සහ අනිකුත් බදාම පිරවුම්; කොම්පෝස්ට්; පොහොර ලෙස යොදා ගන්නා සත්ත්ව මලද්‍රව්‍ය; පොහොර; කර්මාන්ත හා විද්‍යාත්මක කටයුතුවලදී භාවිතා කිරීම සඳහා ජෛව විද්‍යාත්මක සැකසුම්

02 පංතිය — තීන්ත, වාර්නිෂ්, ලැකර්; මලකඩ කෑම වැළැක්වීමේ හා දැව දිරායෑම වැළැක්වීමේ ආරක්ෂණ ද්‍රව්‍ය; වර්ණක, සායම් වර්ග; මුද්‍රණ කටයුතු, සලකුණු කිරීම් හා කැටයම් කෙටීම සඳහා තීන්ත; පිරිසැකසුම් නොකළ ස්වාභාවික රෙසින; පින්තාරු කිරීම, අලංකරණ කටයුතු, මුද්‍රණ කටයුතු හා කලාකටයුතු සඳහා තුනී පත්‍ර ආකාරයෙන් හෝ පවුඩර් ආකාරයෙන් ඇති ලෝහ

03 පංතිය — ඖෂධීය ද්‍රව්‍ය රහිත රූපලාවණ්‍ය සහ නාන කාමර ද්‍රව්‍ය; ඖෂධීය ද්‍රව්‍ය රහිත දන්තාලේපන; සුවඳ විලවුන්; සගන්ධ තෙල්; රෙදි සේදීමේ කාර්යයන් සඳහා විරංජන ද්‍රව්‍ය හා අනිකුත් ද්‍රව්‍ය; පිරිසිදු කිරීමේ, ඔප දැමීමේ, අතුල්ලා පිරිසිදු කිරීමේ සහ සූරා පිරිසිදු කිරීමේ කාර්යයන් සඳහා භාවිතා කරන ද්‍රව්‍ය

04 පංතිය — කාර්මික තෙල් හා ග්‍රීස් වර්ග, වැක්ස් වර්ග; ලිහිසි තෙල්; දූවිලි අවශෝෂක, තෙත් කාරක හා බන්ධන සංයෝග; ඉන්ධන සහ ප්‍රදීපක; ආලෝකකරණය සඳහා ඉටිපන්දම් හා තිර

05 පංතිය — ඖෂධ, වෛද්‍යමය හා පශු වෛද්‍යමය කටයුතු සඳහා ද්‍රව්‍ය; වෛද්‍යමය කටයුතු සඳහා සනීපාරක්ෂක ද්‍රව්‍ය; වෛද්‍යමය හා පශු වෛද්‍යමය කටයුතු සඳහා පෝෂණීය ආහාර සහ ද්‍රව්‍ය, ළදරුවන් සඳහා ආහාර ද්‍රව්‍ය; මිනිසුන් හා සතුන් සඳහා ආහාර අතිරේක; ප්ලාස්ටර්, තුවාලවලට බෙහෙත් දැමීමට ගන්නා ඖෂධ ආදි ද්‍රව්‍ය; දත් කුහර පිරවීමට ද්‍රව්‍ය, දන්ත ඉටි; විෂබීජ නාශක; භෝගනාශක සතුන් විනාශ කිරීමේ ද්‍රව්‍ය; දිලීරනාශක, වල්පැලෑටිනාශක

06 පංතිය — සුලභ ලෝහ හා ඒවයේ මිශ්‍ර ලෝහ, යපස්; ගොඩනැගිලි හා ඉදිකිරීම් කටයුතු සඳහා ලෝහමය ද්‍රව්‍ය; ලෝහමය එහා මෙහා ගෙනයා හැකි ද්‍රව්‍ය; විද්‍යුත් සන්නායක නොවන කේබල් සහ සුලභ ලෝහ වයර්; කුඩා ප්‍රමාණයේ ලෝහමය භාණ්ඩ; ඇසුරුම් කටයුතු හෝ ප්‍රවාහන කටයුතු සඳහා ලෝහමය බහාලුම්; සේප්පු

07 පංතිය — යන්ත්‍ර, යන්ත්‍ර මෙවලම්, බල මෙහෙයුම් මෙවලම්; ගොඩබිම් වාහන සඳහා හැර මෝටර් සහ එන්ජින්; ගොඩබිම් වාහන සඳහා හැර යන්ත්‍ර සම්බන්ධක හා සම්ප්‍රේෂණ සංරචක, අතින් ක්‍රියාත්මක කරන අත් මෙවලම් හැරුණ කොට අනිකුත් කෘෂිකාර්මික උපකරණ; බිත්තර රැක්කවීම සඳහා ඉන්කියුබේටර්, විකිණීමේ කටයුතු සඳහා භාවිතා කරන ස්වයංක්‍රීය යන්ත්‍ර

08 පංතිය — අතින් ක්‍රියාත්මක කරක උපකරණ හා මෙවලම්; හැඳි , ගෑරුප්පු, පිහි ආදි මේසයේ භාවිතාකරන මෙවලම්; ගිනි අවි හැර අනිකුත් දැලේ පලදින අවි; රේසර්

09 පංතිය — විද්‍යාත්මක, නාවික, භූමි මැනුම්, ඡායාරූපකරණ, සිනමාකරණ, ප්‍රකාශ, කිරුම්, මිනුම්, සංඥා කරන, පිරික්සුම් (අධීක්ෂණ), ජීවිතාරක්ෂක හා ඉගැන්වීම් උපකරණ හා මෙවලම්; විද්‍යුත් සන්නයනය, මං මාරුව, පරිණාමණය, සංචය, නියාමනය හෝ පාලනය සඳහා උපකරණ හා මෙවලම්; ශබ්ද හෝ රූප පටිගත කිරීම,

සම්ප්‍රේෂණය හෝ ප්‍රතිනිෂ්පාදනය සඳහා උපකරණ; චුම්බකමය දත්ත වාහක, පටිගත කිරීමේ තැටි; සංයුක්ත තැටි, ඩීවීඩී සහ අනිකුත් ඩිජිටල් පටිගත කිරීමේ මාධ්‍ය; කාසි භාවිතා කර ක්‍රියාත්මක කරන උපකරණ සඳහා යාන්ත්‍රණ; මුදල් ගනුදෙනු සටහන් යන්ත්‍ර; ගණක යන්ත්‍ර; දත්ත සැකසුම් උපකරණ, පරිගණක; පරිගණක මෘදුකාංග; ගිනි නිවීම සඳහා උපකරණ

10 පංතිය ශල්‍ය වෛද්‍ය, වෛද්‍ය, දන්ත වෛද්‍ය හා පශු වෛද්‍ය උපකරණ හා මෙවලම්; කෘත්‍රිම ගාත්‍රා, ඇස් හා දත්; විකලාංග භාණ්ඩ; සූචිකරණ ද්‍රව්‍ය; ආබාධිත තැනැත්තන් සඳහා චිකිත්සක හා ආධාරක උපාංග; සම්භාහන උපකරණ; ළදරු ෙහද කටයුතු සඳහා උපකරණ, උපාංග සහ ද්‍රව්‍ය; ලිංගික කාර්යයන් සඳහා උපකරණ, උපාංග සහ ද්‍රව්‍ය;

11 පංතිය ආලෝක කිරීම, තාපනය, වාෂ්ප උත්පාදනය කිරීම, කෑම පිසීම, ශීතකිරීම, වියළීම, සංවාතනය, ජල සැපයුම හා සනීපාරක්ෂක කාර්යයන් සඳහා උපකරණ

12 පංතිය වාහන; ගොඩබිමින්, ගුවන් මගින් හෝ දියෙන් යාම සඳහා උපකරණ

13 පංතිය ගිනි අවි; පතරොම් සහ ප්‍රක්ෂිප්ත; පුපුරණ ද්‍රව්‍ය; ගිනිකෙළි ද්‍රව්‍ය

14 පංතිය අනෙක් පංතිවලට ඇතුලත් නොවන වටිනා ලෝහ හා ඒවායේ මිශ්‍ර ලෝහ; ස්වර්ණාභරණ, වටිනා හා අර්ධ වටිනාකමින් යුතු ගල් වර්ග; වේලාමාණක හා කාලමාණක උපකරණ

15 පංතිය සංගීත උපකරණ

16 පංතිය කඩදාසි, කාඩ්බෝඩ්; මුද්‍රිත ද්‍රව්‍ය; පොත් බැඳීමේ කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය; ඡායාරූප; ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා, ගෘහ භාණ්ඩ හැර; ලිපිද්‍රව්‍ය සඳහා සහ ගෘහස්ත කාර්යයන් සඳහා ඇලවුම් ද්‍රව්‍ය; කලාශිල්පින් සඳහා ඇඳීමේ ද්‍රව්‍ය හා අනිකුත් අවශ්‍ය ද්‍රව්‍ය; පින්තාරු බුරුසු; උපදේශක හා ඉගැන්වීම් ද්‍රව්‍ය; එතීම හා ඇසුරුම්කරණය සඳහා ප්ලාස්ටික් ෂීට්; පටල හා බෑග්; මුද්‍රණ අකුරු හා මුද්‍රණය සඳහා පින්තූර කඟඩු (ප්‍රින්ටින්ග් බ්ලොක්ස්)

17 පංතිය පිරිසැකසුම් නොකළ හා අර්ධ වශයෙන් පිරිසැකසුම් කළ රබර්, ගටා පර්චා, ගම්, ඇස්බැස්ටස්, තලාතු මිනිරන් (මයිකා) හා මෙම සියලු ද්‍රව්‍ය සඳහා ආදේශක; නිෂ්පාදනයේදී භාවිතා කිරීම සඳහා අච්චුවක් තුළින් තල්ලු කොට ඇද හැඩගස්සවන ලද ප්ලාස්ටික් සහ රෙසින; ඇසිරීමට, ඇබ ගැසීමට හා පරිවරණ කාර්යයන් සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය; ලෝහමය නොවන නම්‍යශීලී පයිප්ප, ටියුබ් සහ හෝස්

18 පංතිය හම් හා හම් අනුකරණ; සත්තව හම්, හයිඩ්ස්; ගමන් මලු හා භාණ්ඩ එහා මෙහා රැගෙන යෑමේ බෑග්; කුඩ, අව් ආවරණ කුඩ; ඇවිදිමේදී භාවිතා කරන සැරයටි; කස, පොරොදු සහ සෑදල උපකරණ; සතුන් සඳහා කරපටි, දම්වැල් හා ඇඳුම් පැලඳුම්

19 පංතිය ගොඩනැඟිලි තැනීමේ ද්‍රව්‍ය (ලෝහමය නොවන); ගොඩනැඟිලි සඳහා ලෝහමය නොවන දෘඪ පයිප්ප; ගල්තාර, තාර සහ බිටුමන්; ලෝහමය නොවන එහා මෙහා ගෙනයාහැකි ගොඩනැඟිලි; ලෝහමය නොවන ස්මාරක

20 පංතිය ගෘහ භාණ්ඩ, කණ්ණාඩි, පින්තූර රාමු; ගබඩා කටයුතු හෝ ප්‍රවාහන කටයුතු සඳහා බහාලුම්; වැඩ නොදමන ලද හෝ අර්ධ වශයෙන් වැඩ දමන ලද මුතු, කවච, මීර්ෂෝම්, කහ පැහැති ඇම්බර්

21 පංතිය ගෘහස්ත හෝ මුළුතැන්ගෙයි උපකරණ හා බහාලුම්; ගෑරුප්පු, පිහි හා හැඳි හැරුන කොට අනිකුත් ආහාර පිසීමේ හා මේස සඳහා භාවිතා කරන උපකරණ; පනා සහ ස්පොන්ජ් වර්ග; තීන්ත බුරුසු හැර අනිකුත් බුරුසු වර්ග; බුරුසු සෑදීමට ගන්නා ද්‍රව්‍ය; පිරිසිදු කිරීමේ කාර්යය සඳහා භාවිතා කරන ද්‍රව්‍ය; ගොඩනැඟිලි සඳහා භාවිතා කරන වීදුරු හැර, කැටයම් නොකළ හෝ අර්ධ වශයෙන් කැටයම් කරන ලද වීදුරු; වීදුරු භාණ්ඩ, පෝසිලේන් භාණ්ඩ හා මැටි භාණ්ඩ

22 පංතිය කඹ සහ ලණු; දැල්; කූඩාරම් හා කැන්වස් රෙදි; රෙදි හෝ කෘත්‍රිමව සංශ්ලේෂණය කළ ද්‍රව්‍ය වලින් නිර්මිත දොරකඩවල් හා සාප්පු ජනෙල්වලට යොදන හිරු හා වැසි ආවරණ; රුවල්; තොග වශයෙන් ද්‍රව්‍ය ප්‍රවාහනය

හා ගබඩා කිරීම සඳහා ගෝනි මලු; කඩදාසි, කාඩ්බෝඩ්, රබර් හෝ ප්ලාස්ටික් හැර සන කිරීම, කුෂන් කිරීම හා පිරවීම සඳහා යොදාගන්නා ද්‍රව්‍ය; අමු තන්තුමය රෙදි විවීමට ගන්නා කෙඳි නූල් ආදිය හා ඒවා සඳහා ආදේශක;

23 පංතිය රෙදි සඳහා කැටිනූල් සහ නූල්

24 පංතිය රෙදිපිළි හා රෙදිපිළි සඳහා ආදේශක; ගෘහස්ත රෙදි; රෙදි හෝ ප්ලාස්ටික් තිරරෙදි

25 පංතිය ඇඳුම්, පාවහන්, හිස්වැසුම්

26 පංතිය රේන්ද පටි හා එම්බ්‍රොයිඩර්, පිත්ත පටි හා ගෙතුම්පටි; බොත්තම්, හක් හා පුඩු, අල්පෙනෙති හා ඉඳිකටු; ඉඳිකටු ඇසුරුම් පෙට්ටි; කෘත්‍රිම මල්; කොණ්ඩා මෝස්තර; ව්‍යාජ හිසකෙස්

27 පංතිය කාපට්, පාපිසි, පැදුරු හා ලණු පැදුරු, ලිනෝලියම් හා අනිකුත් බිම ඇතුරුම් ද්‍රව්‍ය, බිත්ති සැරසිලි (රෙදි වලින් නිර්මාණය කරන ලද නොවන)

28 පංතිය ක්‍රීඩා, සෙල්ලම් භාණ්ඩ හා ක්‍රීඩා භාණ්ඩ; වීඩියෝ ක්‍රීඩා උපකරණ; ජිම්නාස්ටික් හා ක්‍රීඩා භාණ්ඩ; නත්තල් ගස් සැරසිලි කිරීම සඳහා ද්‍රව්‍ය

29 පංතිය මස්, මාළු, කුකුළු මස්; මස් නිස්සාරක; සංරක්ෂිත, ශීතකළ, වියලූ සහ පිසින ලද පලතුරු සහ එළවළු; ජෙලි,ජෑම්, කල්තබා ගැනීමට සිරප්වල බහාලූ හෝ සිරප්වලින් පිසූ පලතුරු; බිත්තර; කිරි හා කිරි නිෂ්පාදන; ආහාරයට ගනු ලබන තෙල් හා මේද වර්ග

30 පංතිය කෝපි, තේ, කොකෝවා හා කෘත්‍රිම කෝපි; සහල්; මඤ්ඤොක්කා පිටි හා සව්; ධාන්‍ය පිටි හා ධාන්‍ය වලින් පිළියෙල කරන ලද ද්‍රව්‍ය; පාන්, පේස්ට්‍රි හා රසකැවිලි; ආහාරයට ගන්නා අයිස් වර්ග, සීනි, පැණි, මී පැණි; යීස්ට්, බේකිංපවුඩර්; ලුණු, අබ; විනාකිරි, සෝස් වර්ග (තුනපහ); කුළුබඩු, අයිස් (මිදවීම කළ ජලය)

31පංතිය අමු හා සැකසුම් නොකළ කෘෂිකාර්මික, මත්ස්‍ය, උද්‍යාන වගා හා වනවගා නිෂ්පාදන; අමු හා සැකසුම් නොකළ ධාන්‍ය හා බීජ; නැවුම් පලතුරු හා එළවළු, නැවුම් පැලෑටි; ස්වාභාවික ගස් හා මල්වර්ග; පැල කිරීම සඳහා බල්බ, පැල හා බීජ; සජීවී සතුන්; සතුන් සඳහා ආහාර සහ පානවර්ග; මෝල්ට්

32 පංතිය බියර්; ඛනිජ ජලය හා වාතීකෘත ජලය සහ අනෙකුත් මධ්‍යසාර නොවන පාන වර්ග; පලතුරු බීම හා යුෂ වර්ග; සිරප් සහ පානවර්ග සෑදීමට භාවිතා කිරීමට පිළියෙල කරන ලද අනෙකුත් සැකසුම්

33 පංතිය මධ්‍යසාරීය පානවර්ග (බියර් හැර)

34 පංතිය දුම්කොළ; දුම්පානය කරන තැනැත්තන් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය; ගිනිකූරු

*සේවා*

35 පංතිය වෙළඳ ප්‍රචාරණය; ව්‍යාපාර කළමනාකරණය; ව්‍යාපාර පරිපාලනය; කාර්යාලීය කටයුතු

36 පංතිය රක්ෂණ කටයුතු; මූල්‍යමය කටයුතු; මුදල් කටයුතු; ඉඩම්කඩම් දේපළ කටයුතු

37 පංතිය ගොඩනැඟිලි ඉදිකිරීම; අළුත්වැඩියාව; ස්ථාපනය කිරීමේ සේවා

38 පංතිය විදුලි සංදේශ සේවා

39 පංතිය ප්‍රවාහනය; භාණ්ඩ ඇසුරුම් කිරීම හා ගබඩාකිරීම; සංචාරක කටයුතු සංවිධානය

40 පංතිය ද්‍රව්‍ය පිරියම් කිරීම

41 පංතිය අධ්‍යාපනය; පුහුණුව සැපයීම; විනෝදාත්මක කටයුතු; ක්‍රීඩා සහ සංස්කෘතික කටයුතු

| | |
|---|---|
| 42 පංතිය | විද්‍යාත්මක සහ තාක්ෂණික සේවා සහ එයට අදාල පර්යේෂණ හා සැලසුම් සේවා; කාර්මික විශ්ලේෂණ හා පර්යේෂණ සේවා; පරිගණක දෘඩාංග සහ මෘදුකාංග සැලසුම් කිරීම හා වැඩි දියුණු කිරීම |
| 43 පංතිය | ආහාර සහ පානවර්ග සැපයීම සඳහා සේවා; තාවකාලික නවාතැන් |
| 44 පංතිය | වෛද්‍ය සේවා; පශු වෛද්‍ය සේවා; මිනිසුන් හෝ සතුන් සඳහා සනීපාරක්ෂක හා රූපලාවණ්‍ය සත්කාරක; කෘෂිකාර්මික, උද්‍යාන වගා හා වන කළමනාකරණ සේවා |
| 45 පංතිය | නීති සේවා; ස්පෘශ්‍ය දේපළ සහ තැනැත්තන්ගේ භෞතික ආරක්ෂාව සඳහා ආරක්ෂක සේවා; තනි පුද්ගලයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා අන්‍යයන් විසින් සපයනු ලබන පුද්ගලික හා සමාජ සේවා |